# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන)

**සිවිල් නඩු විධාන සංග්‍රහය (627 වන වගන්තිය) සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

මාතලේ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා විසින්
2020 දෙසැම්බර් මස 02 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2020 සැප්තැම්බර් මස 25 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

**[19 වන පනත් කෙටුම්පත]**


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : රු. 6.00** **තැපැල් ගාස්තුව : රු. 15.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන)

## සිවිල් නඩු විධාන සංග්‍රහය (627 වන වගන්තිය) සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2020 අංක දරන සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

627 වන වගන්තිය සංශෝධනය කිරීම.

**2.** "ඉස්ලාම් ධර්මය අදහන තැනැත්තන් අතර" යන වචන ඉවත් කොට ඒ වෙනුවට "මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත ප්‍රකාරව සිදු කළ" යන වචන ආදේශ කිරීම සඳහා සිවිල් නඩු විධාන සංග්‍රහයේ 627 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**3.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.